කෘෂිකර්මය

10 ශ්‍රේණිය

කාර්ය පත්‍රිකා සංග්‍රහය

කලාප අධ්‍යාපන කාර්යාලය
අම්පාර

ඒකකය - ශ්‍රී ලංකාවේ සංවර්ධනයට කෘෂිකර්මාන්තයේ දායකත්වය

ගුරුභවතාගේ නම : එස්.ඒ.ජේ.එම්.සමරනායක - අම්/දමන මහා විද්‍යාලය

කාර්ය පත්‍රිකා අංක 01

පාඩම හොඳින් අධ්‍යනය කර සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ශ්‍රී ලංකාවට "පෙරදිග ධාන්‍යාගාරය" ලෙස විරුදාවලිය ලැබී තිබුනේ,
   I. ධාතුසේන රජ දවසය. II. මහසෙන් රජ දවසය.
   III. පරාක්‍රමබාහු රජ දවසය. IV. වසභ රජ දවසය.
2. පුරාණ රජ දවස ශ්‍රී ලංකාව ආහාරවලින් ස්වයංපෝෂිතව පැවතීමට ප්‍රධාන හේතුව වූයේ,
   I. දෙමුහුම් බෝග වර්ග වගා කිරීම.
   II. උසස් වාරි තාක්ෂණයක් යොදා ගැනීම.
   III. රසායනික පොහොර භාවිතයෙන් තොරව වගා කටයුතු කිරීම.
   IV. රෝග පළිබෝධවලට ප්‍රතිරෝධී බෝග ප්‍රභේද වගාව.
3. අනුරාධපුර යුගයේ ඉදි කෙරුණු ශ්‍රී ලංකාවේ ප්‍රථම වැව,
   I. කලා වැව. II. පරාක්‍රම සමුද්‍රය.
   III. අභය වැව. IV. මින්නේරි වැව.
4. වැවක සොරොව්වෙන් පිටවන ජලයේ පීඩනය පාලනය කිරීම සඳහා සකස් කර ඇති ව්‍යුහය,
   I. රුළපනාව. II. වැව් බැම්ම.
   III. බිසෝ කොටුව. IV. වානේ දොරටුව.
5. කලා වැවේ සිට තිසා වැවට ජලය ගෙනයන ජය ගඟ හෙවත් යෝධ ඇළ වාරි කර්මාන්ත ඉතිහාසයේ අතිශයින් වැදගත් සන්ධිස්ථානයකි. මෙම ඇළ ඉදිකරණ ලද්දේ,
   I. වසභ රජතුමා විසිනි. II. මහසෙන් රජතුමා විසිනි.
   III. ධාතුසේන රජතුමා විසිනි. IV. පරාක්‍රමබාහු රජතුමා විසිනි.
6. පෘතුගීසි සහ ලන්දේසි පාලන සමයේ ලංකාවේ වැවිලි කර්මාන්තයට පදනම දමමින් කොළඹ, කුරුඳුවත්ත, කදිරාන යන ස්ථානවල වගා කළ බෝගය වන්නේ,
   I. ගම්මිරිස් II. කුරුඳු
   III. පුවක් IV. සාදික්කා
7. දේශීය ආහාර නිෂ්පාදනය නැංවීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවන ලද්දේ,
   I. වර්ෂ 1912 දී ය. II. වර්ෂ 1822 දී ය.
   III. වර්ෂ 1948 දී ය. IV. වර්ෂ 1825 දී ය.
8. **"මඩ සෝදාගත් කල හෙළ ගොවියා රජකමට පවා සුදුසු ය"** යන ප්‍රසිද්ධ කියමන ප්‍රකාශ කරන ලද්දේ,
   I. මහා පරාක්‍රමබාහු රජතුමා විසිනි.
   II. රෝබට් නොක්ස් නම් ලේඛකයා විසිනි.
   III. මහසෙන් රජතුමා විසිනි.
   IV. රොබට් බ්‍රවුන්රින් ආණ්ඩුකාර තුමා විසිනි.
9. ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු බිහි වූ ගොවි ජනපද සහ බහු කාර්ය යෝජනා ක්‍රම වල පොදු අරමුණක් නොවන්නේ,
   I. කෘෂි නිෂ්පාදන ඉහළ දැමීම.
   II. ඉඩම් නොමැති අයට ඉඩම් ලබා දීම.
   III. පහල නිම්නවල ජල ගැලීම් පාලනය.
   IV. සත්ත්ව නිෂ්පාදන දිරි ගැන්වීම.

10. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් පසු කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වෙනස්කම්වලට හේතු නොවූ සාධකයක් වන්නේ,
    I. තලවකැලේ තේ පර්යේෂණ ආයතනය පිහිටුවීම.
    II. ලුනුවිල පොල් පර්යේෂණ ආයතනය පිහිටුවීම.
    III. අගලවත්ත රබර් පර්යේෂණ ආයතනය පිහිටුවීම.
    IV. අම්පාර දිස්ත්‍රික්කයේ උක් පර්යේෂණ ආයතනය පිහිටුවීම.

II කොටස

01. කෘෂිකර්මාන්තයේ ප්‍රධාන අංශ දෙක සඳහන් කරන්න.
02. අතීත ශ්‍රී ලංකා ශිෂ්ටාචාරය තුළ සාර්ථක කෘෂිකර්මාන්තයක් පැවතුනේ කුමන වගා යටතේ ද?
03. යැපුම් කෘෂිකර්මාන්තය යනු කුමක් දැයි අර්ථ දක්වන්න.
04. පුරාණ ශ්‍රී ලංකාවේ ස්වයංපෝෂිත බව ළඟා කර ගැනීමට දායකත්වය ලබා දුන් අංශ 03 නම් කරන්න.
05. පුරාණ ලංකාවේ කෘෂි ආර්ථිකය කෙරෙහි රාජ්‍ය අනුග්‍රහය ලැබුනු බවට ඇති සාක්ෂි 03ක් ලියන්න.
06. දේශීය වාරි තාක්ෂණයේ මූලික අංගය වන වැවක ප්‍රධාන කොටස් පහක් නම් කර ඉන් ඉටුවන කාර්යයන් සඳහන් කරන්න.
07. පුරාණ ගම්වල ගොවිතැන හා බැඳුණ සංස්කෘතියක් පැවති බව තහවුරු කිරීම සඳහා කරුණු 03ක් ඉදිරිපත් කරන්න.
08. විදේශ ආක්‍රමණ මගින් දේශීය කෘෂිකර්මාන්තයට සිදු වූ බලපෑම් වාසි හා අවාසි ලෙස වගුගත කරන්න.
09. ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසුව ගොවි ජනපද සහ බහු කාර්ය යෝජනා ක්‍රම බිහි විය. එවැනි යෝජනා ක්‍රම පහක් (05) සඳහන් කරන්න.
10. 1960 දශකයේ අග භාගයේ දී ශ්‍රී ලංකාවේ කෘෂි බෝගවල අස්වනු වැඩි වීමට හේතුවක් ලෙස හරිත විප්ලවය හඳුන්වා දිය හැකිය. හරිත විප්ලවය යනු කුමක්දැයි අර්ථ දක්වන්න.
11. හරිත විප්ලවය සමඟ කෘෂිකර්මාන්තයේ සිදු වූ වෙනස්කම් හතරක් ලියන්න.
12. ශ්‍රී ලංකාවේ සංවර්ධනය කෙරෙහි කෘෂිකර්මාන්තයේ දායකත්වය ලබා දෙන ආකාරය කරුණු 04ක් ඇසුරින් සඳහන් කරන්න.
13. ආහාර සුරක්ෂිතතාවය අර්ථ දක්වන්න.
14. ආහාර සුරක්ෂිතතාව කෙරෙහි බලපාන ප්‍රධාන සාධක තුන සඳහන් කරන්න.
15. අප රටෙහි දළ දේශීය නිෂ්පාදනයට ප්‍රධාන අංශ තුනක් යටතේ දායකත්වය ලබා දෙයි. එම අංශ තුන සඳහන් කරන්න.
16. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සඳහා පවතින විභවතා 05ක් සඳහන් කරන්න.
17. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටවීමෙන් පසු කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වෙනස්කම්වලට හේතු වූ ප්‍රධාන සංසිද්ධි 05 ලියන්න.

ඒකකය - කෘෂිකාර්මික කටයුතු කෙරෙහි දේශගුණික සාධක වල බලපෑම

ගුරුභවතාගේ නම : ඩී.බී.ඩී.කේ.කල්හාරි දන්තනාරායන - අම්/මාන්තොට්ටම මහා විද්‍යාලය

කාර්ය පත්‍රිකා අංක 02

(01). සංවහන වැසි වල විශේෂ ලක්ෂණයක් වන්නේ,

I. තද සුළං හා අඛණ්ඩව දින දෙක තුනක් පවතින වර්ෂාවය.

II. සවස් කාලයේ ගිගුරුම් සහිත තද වැසි හා රාත්‍රියේ පැහැදිලි අහසක් පැවතීමය.

III. වර්ෂයේ නියමිත කාල සීමාවකදී නිශ්චිත ප්‍රදේශවලට වර්ෂාව ලැබීමය.

IV. කෙටි කාලයක් තුළ අධික තීව්‍රතාවයකින් තද වර්ෂාවක් ලෙස පතිත වීමයි.

(02). යම් ශාකයක ප්‍රභාසංස්ලේෂණ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා වැදගත් වන ආලෝකයේ වර්ණය වන්නේ,

I. රතු හා තැඹිලි.

II. රතු හා කහ.

III. රතු හා කොළය.

IV. රතු හා නිල්ය.

(03). වාර්ෂික වර්ෂාපතනය 2500mm ට වැඩි , උච්චත්වය 300mm ට වඩා අඩු ප්‍රදේශයක් සංකේත කරන්නේ පහත කුමන අක්ෂර වලින් ද?

I. IL

II. WL

III. WU

IV. WM

(04). කෘෂි දේශගුණික කලාප වර්ගීකරණය පදනම්ව ඇති සාදක වන්නේ,

I.වර්ෂාපතනය හා උච්චත්වය

II. වර්ෂාපතනය හා භූමි භාවිතය

III. වර්ෂාපතනය හා පස් වර්ග

IV. උච්චත්වය හා වගා කල හැකි බෝග වර්ගය

(05). සුළං දිශා දර්ශකයක ඊ හිස ඊසාන දෙසට යොමු වී ඇති අවස්ථාවක සුළං හමා එනු ලබන්නේ,

I.නිරිත සිට ඊසාන දෙසට

II. ඊසාන සිට නිරිත දෙසට

III. ඊසාන සිට බටහිර දෙසට

IV. දකුණ සිට ඊසාන දෙසට

(06). පුෂ්ප හටගැනීමට දිගු දිවා කාලයක් අවශ්‍ය ශාක දිගු දිවා ශාක ලෙස හැදින්වේ.දිගු දිවා ශාක කාණ්ඩයකි,

I. බීට්,කැරට්,රාබු හා සලාද

II. මිරිස්,කව්පි,බෝංචි හා තක්කාලි

III. උක්,කොපි,වී හා දුම්කොළ

IV. මුං,ස්ට්‍රෝබෙරි,වී හා පොල්

(07). වර්ෂාමානයක් ස්ථාන ගත කිරීමේදී පුනීලයේ කට පොළව මට්ටමේ සිට තැබිය යුතු සම්මත ප්‍රමාණය,

I. 40cm කි.

II. 30cm කි.

III. 35cm කි.

IV. 20cm කි.

(08). වැඩි සාපේක්ෂ ආර්ද්‍රතාවය බෝග වගාවට අහිතකර බලපෑම් ඇති කරන අවස්ථාද වේ. එවැනි අවස්ථාවක් වන්නේ,

I. බීජ ප්‍රරෝහණයට වැඩි කාලයක් ගත වීමය.

II. ශාක රෝග සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීමය.

III. බිගෝනියා හා පර්ණාංග වල (මී වන) වර්ධනය බාල වීමය.

IV. ශාක ප්‍රචාරණයේ දී, දඬු කැබලි මුල් ඇද්දවීම පමා වීම.

(09). සටහන් නොවන වර්ෂාමනය තුල එකතු වන වර්ෂා ජල ප්‍රමාණය අනුව වර්ෂාපතනය ප්‍රකාශ කෙරේ. එහිදී මනිනු ලබන්නේ එම ජල කොටසේ,

I. උස

II. පරිමාව

III. ඝනත්වය

IV. ස්කන්දය

(10). ශ්‍රී ලංකාවේ තෙත් කලාපීය කුඹුරුවල ඒකීය ක්ෂේත්‍රඵලයකින් ලැබෙන වී අස්වැන්න , වියළි කලාපීය කුඹුරුවල ඒකීය ක්ෂේත්‍රඵලයකින් ලැබෙන වී අස්වැන්නට වඩා අඩුය.මෙයට ප්‍රධාන හේතුව වන්නේ,

I. පස සාරවත් බවින් අඩු වීමය.

II. අහස බොහෝවිට වළාකුළු වලින් බර වීමයි.

III. රෝග හා කෘමි උවදුරු වැඩි වීමයි

IV. වර්ෂාපතනය වැඩි වීමයි.

කෙටි ප්‍රශ්න

(01) I. පහත දැක්වෙන්නේ බෝග වගාවට බලපාන දේශගුණික සාධක හා ඒවා මනිනු ලබන උපකරණ සඳහන් වගුවකි.A සිට I දක්වා හිස්තැන් පුරවන්න.

දේශගුණික සාධකය	මනිනු ලබන උපකරණය	මිනුම් ඒකකය
වර්ෂාපතනය	A.	B. ....
C.	අනිල මානය	D. ....
E.	F.	සෙල්සියස් අංශක
ආලෝක තිව්‍රතාවය	G.	H. ....
I.	J.	ප්‍රතිශතය

II. ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ප්‍රධාන ක්‍රම 03 නම් කරන්න.

III. ඒ අනුව යල හා මහ කන්නවලට අයත්වන කාල වකවානු සඳහන් කරන්න.

(02).I. විවිධ ප්‍රදේශවල උෂ්ණත්වය වෙනස් වීමට බලපාන සාධක 4ක් නම් කරන්න.

II. බෝග වගාවට වර්ෂාපතනයෙන් ඇති හිතකර හා අහිතකර බලපෑම් දෙකක් බැගින් ලියන්න.

III. බෝග වගාවට සුළඟ හිතකර හා අහිතකර වන ආකාර 02ක් බැගින් ලියන්න.

(03).I. ශ්‍රී ලංකාව බෙදා දක්වන කෘෂි පාරිසරික කලාප සංඛ්‍යාව කොපමණ ද?

II. කෘෂි පාරිසරික කලාප වර්ගීකරණයේ වැදගත්කම් 02ක් ලියන්න.

III. ශ්‍රී ලංකාව බෙදා ඇති ප්‍රධාන දේශගුණික කලාප නම් කර,ඒවායේ වර්ෂාපතන ප්‍රමාණ සඳහන් කරන්න.

(04).I. කාලගුණය හා දේශගුණය අතර ඇති වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

II. ශ්‍රී ලංකාවට අන්තර් මෝසම් වැසි ලැබෙන කාල වකවානු වෙන වෙනම ලියන්න.

III. බෝග වගාවට සාපේක්ෂව ආර්ද්‍රතාවය හිතකර හා අහිතකර ලෙස බලපාන අවස්ථා 02 බැගින් ලියන්න.

(05).I.පහත දැක්වෙන කෘෂි දේශගුණික කලාප සංකේතයෙන් ලියන්න.

a. මැදරට තෙත් කලාපය
b. උඩරට අතරමැදි කලාපය
c. පහතරට වියළි කලාපය

II. පහත දැක්වෙන එක් එක් දේශගුණික කලාපයක් බෙදෙන කෘෂි පාරිසරික කලාප ගණන ලියන්න.

a. තෙත් කලාපය
b. අතරමැදි කලාපය
c. වියළි කලාපය

III. ආලෝක තිව්‍රතාවයේ හිතකර හා අහිතකර බලපෑම් 02 බැගින් ලියන්න.

ඒකකය - පස

ගුරුභවතාගේ නම : එස්.ඒ.ජේ.එම්.සමරනායක - අම්/දමන මහා විද්‍යාලය

කාර්ය පත්‍රිකා අංක 03

1. පාෂාණවලින් පස නිර්මාණය වීමේ ක්‍රියාවලිය මෙසේ සරලව දැක්විය හැකිය.



A සහ B ස්ථාන වලදී සිදුවන ක්‍රියාවලින් පිළිවෙලින්,

I. පාෂාණ ජීර්ණය, පාංශු ජනනය II. පාංශු ජනනය, පාෂාණ ජීර්ණය
III. පාෂාණ හායනය, පාංශු ජනනය IV. පාංශු ජනනය, පාෂාණ හායනය

2. පාංශු ජනනයට මූලික වන පාෂාණ ඒවායේ සම්භවය අනුව වර්ග තුනකට බෙදා දැක්විය හැකිය. ඉන් ආග්නේය පාෂාණ සඳහා උදාහරණ වන්නේ,

I. ක්වාට්ස්, ග්‍රැනයිට්, පෙග්මටයිට් II. වැලිගල්, ෂේල්, තිරුවානා
III. කිරිගරුඬ, ෂේල්, පෙග්මටයිට් IV. ෂේල්,ගැනයිට්, කිරිගරුඬ

3. අන්තර්ජාතික පාංශු විද්‍යා සංගමයේ වර්ගීකරණය යටතේ අංශුවල විෂ්කම්භය අනුව පාංශු ඛනිජ වර්ගයක් වන රොන්මඩ වල විෂ්කම්භය වන්නේ,

I. විෂ්කම්භය මි.මි.0.002 වඩා කුඩා අංශු
II. විෂ්කම්භය මි.මි.0.2 මි.මි.0.02 දක්වා අංශු
III. විෂ්කම්භය මි.මි.0.02 මි.මි.0.002 දක්වා අංශු
IV. විෂ්කම්භය මි.මි.2 ට වඩා විශාල අංශු

4. යම් පසක ක්ෂුද්‍ර අවකාශ තුළ ඇති කේශාකර්ෂණ ජලය හා පස් අංශු වටා ඇති ජලාකර්ෂණ ජලය උපරිම ධාරිතාවයෙන් පවතින විට එම පස,

I. සංතෘප්ත මට්ටමක පවතින පසක් ලෙස හඳුන්වයි.
II. ක්ෂේත්‍ර ධාරිතාවේ පවතින පසක් ලෙස හඳුන්වයි.
III. ස්ථිර මැලවීමේ අංකය අවස්ථාවේ පවතින පසක් ලෙස හඳුන්වන්යි.
IV. තාවකාලික මැලවීමේ අංකය යටතේ පවතින පසක් ලෙස හඳුන්වයි.

5. පාංශු වයනය නිර්ණය කිරීමට සිසුන් පිරිසක් විසින් රෝල් ක්‍රමයට කරන පරීක්ෂණයේ ප්‍රතිඵල කිහිපයක් පහත දැක්වේ.



A B C D

ඉන් මැටි පසක් හා වැලි පසක් දැක්වෙන රූප පිළිවෙලින්,

I. A සහ B II. C සහ D
III. A සහ D IV. A සහ C

6. ප්‍රබල ආම්ලික පසක PH පරිමාව වන්නේ,

I. 4.5 ට අඩු II. 4.5 – 6.5 දක්වා
III. 7.3 – 8.3 දක්වා IV. 8.4 ට වැඩි

7. ශ්‍රී ලංකාවේ පස විවිධ ලක්ෂණ පදනම් කරගෙන කාණ්ඩ 14කට බෙදා දක්වා ඇත. ඉන් රතු දුඹුරු පස දැකිය හැකි දිස්ත්‍රික්ක වන්නේ,
   - I. අනුරාධපුරය, පොළොන්නරුව, මොනරාගල
   - II. මහනුවර, මාතලේ, බදුල්ල
   - III. නුවරඑළිය, අනුරාධපුරය, මොනරාගල
   - IV. මාතලේ, කොළඹ, ගම්පහ
8. පසේ තද බව නිසා ඇතිවන අහිතකර බලපෑමක් නොවන්නේ,
   - I. ශාක මුල්වල වර්ධනයට බාධා ඇති වේ.
   - II. පස තුළට ජලය අවශෝෂණය වීම අඩු වේ.
   - III. ක්ෂුද්‍ර ජීවී වර්ධනයට බාධා ඇති නොවේ.
   - IV. පසේ ජලවහනය දුර්වල වේ.
9. පාංශු ජීවීන්ගේ අහිතර බලපෑමක් වන්නේ,
   - I. නයිට්‍රීහරණය මගින් ශාක පෝෂකයක් වන නයිට්‍රජන් පසෙන් ඉවත් කරයි.
   - II. කාබනික ද්‍රව්‍ය වියෝජනය කරයි.
   - III. පස මිශ්‍ර කරයි.
   - IV. ඇලෙනසුලු ද්‍රව්‍ය පිටකිරීම නිසා පාංශු කැටිති ඇතිවීම පහසු කරයි.
10. පාංශු ජල වර්ග අතරින් ශාකවලට අවශෝෂණය කරගත හැකි ජල වර්ගය වන්නේ.
   - I. ගුරුත්වාකර්ෂණ ජලය
   - II. කේෂාකර්ෂණ ජලය
   - III. ජලාකර්ෂණ ජලය
   - IV. ගලායන ජලය

II කොටස

01. පස මගින් ඉටුකරන සුවිශේෂී කාර්යයන් 05ක් ලියන්න.
02. පාංශු ජනනයට මූලික වන පාෂාණ ඒවායේ සම්භවය අනුව වර්ග තුනකට බෙදා දැක්විය හැකිය. එම කොටස් තුන නම් කරන්න.
03. අවසාදිත පාෂාණ නිර්මාණය වන ආකාරය කෙටියෙන් හඳුන්වා එම පාෂාණ වලට උදාහරණ 2ක් ලියන්න
04. පාෂාණ ජීර්ණය සිදුවන ප්‍රධාන ආකාර දෙක සඳහන් කරන්න.
05. එම ජීර්ණ ක්‍රම දෙක කෙටියෙන් අර්ථ දක්වන්න.
06. දර්ශිය පාංශු පැතිකඩක A, B, C, R කොටස් නම් කරන්න.
07. පාංශු සංඝටක නම් කරන්න.
08. බෝග වගාවට සුදුසු පසක තිබිය යුතු පාංශු සංඝටක ප්‍රතිශත සඳහන් කරන්න.
09. පාංශු වාතයේ ඇති වැදගත්කම් 4ක් ලියන්න.
10. පාංශු ජලයේ ප්‍රධාන ආකාර තුන සඳහන් කරන්න.
11. පස් අංශු අතර ඇති ක්ෂුද්‍ර හා මහා අවකාශ ජලයෙන් පිරී ගිය අවස්ථාව පසක සංතෘප්ත මට්ටම ලෙස හඳුන්වයි. මෙවැනි පසක් ශාක වලට අහිතකර වේ. එයට හේතුව කුමක් ද?
12. පාංශු ජීවීන්ගේ හිතකර හා අහිතරක ලක්ෂණ 4 බැගින් නම් කරන්න.
13. පසක දැකිය හැකි ප්‍රධාන පාංශු ලක්ෂණ 3 නම් කරන්න.
14. පාංශු වයනයේ කෘෂිකාර්මික වැදගත්කම් 4ක් ලියන්න.
15. පාංශු ව්‍යුහකාර 4 නම් කරන්න.
16. පාංශු ව්‍යුහය ආරක්ෂා කිරීම සඳහා ගත හැකි පියවර තුනක් සඳහන් කරන්න.
17. පාංශු රසායනික ලක්ෂණ දෙක සඳහන් කරන්න.
18. පසක් ආම්ලික වීමට බලපාන හේතු 03ක් සඳහන් කරන්න.
19. පාංශු හායනයට ලක් වූ පසක් නැවත බෝග කළ හැකි තත්ත්වයට පත් කිරීම සඳහා අවධානය යොමු කළ යුතු කරුණු 02ක් ලියන්න.
20. පාංශු ඛාදනය හඳුන්වා පාංශු ඛාදනයේඅවස්ථා තුන සඳහන් කරන්න.

ඒකකය - ශාක වර්ගීකරණය

ගුරුභවතාගේ නම : ජේ.ජී. විමලාවතී - අම්/දිවුලාන විද්‍යාලය

කාර්ය පත්‍රිකා අංක 04

I - කොටස

➢ **01 සිට 10 දක්වා වූ ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

01) පහත සඳහන් බෝග අතරින් සින්ජිබරේසියේ කුලයට අයත් ශාක කාණ්ඩය තෝරන්න.
- I. අඹ , කහ
- II. කහ , ඉරිඟු
- III. ඉඟුරු , කහ
- IV. ඉරිඟු , තිරිඟු

02) දැනට පිළිගත් විද්‍යාත්මක ශාක වර්ගීකරණය ඉදිරිපත් කරන ලද්දේ,
- I. ස්වීඩන් ජාතික කැරෝලස් ලිනේයස් ය.
- II. ජර්මන් ජාතික කැරෝලස් ලිනේයස් ය.
- III. ප්‍රංශ ජාතික කැරෝලස් ලිනේයස් ය.
- IV. රුසියන් ජාතික කැරෝලස් ලිනේයස් ය.

03) ලෝකයේ සෑම රටකම ඕනෑම බෝගයක් හැඳින්වීමට යොදාගන්නේ එකම නාමයයි. එය,
- I. බෝග ප්‍රභේද වේ.
- II. බෝග ගණ නාමය වේ.
- III. විද්‍යාත්මක නාමය වේ.
- IV. ශාක කුල නාමයයි.

04) ශාකයක විද්‍යාත්මක නාමය ලිවීමේදී භාවිත වන්නේ,
- I. ගණය හා කිලයයි.
- II. ගණය හා විශේෂයයි.
- III. කුලය හා විශේෂයයි.
- IV. වර්ගය හා ගණයයි.

➢ **පහත සඳහන් වගුව ඇසුරෙන් 05 - 08 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A	B	C	D
කරවිල පිපිඤ්ඤා වට්ටක්කා කැකිරි	තක්කාලි මාළුමිරිස් දුම්කොළ වම්බටු	වී කුරක්කන් බඩඉරිඟු මෙනේරි	මෑ උඳු මුං කඩල

05) ඉහත වගුවට අනුව කුකුර්බිටේසියේ කුලයට අයත් බෝග කාණ්ඩය වන්නේ,
I. A ය. II. B ය. III. C ය. IV. D ය.

06) මෙම වගුවෙහි බෝග අතුරින් රනිල කුලයට අයත් බෝග කාණ්ඩය වන්නේ,
I. A ය. II. B ය. III. C ය. IV. D ය.

07) ඉහත වගුවට අනුව සොලනේසියේ කුලයට අයත් බෝග කාණ්ඩය වන්නේ,
I. A ය. II. B ය. III. C ය. IV. D ය.

08) මෙම වගුවෙහි බෝග අතුරින් තන්තු මුල් පද්ධතියක් ඇතිව වැඩෙන බෝග කාණ්ඩය කුමක්ද.?
I. A ය. II. B ය. III. C ය. IV. D ය.

09) බෝහ වර්ගීකරණය ප්‍රධාන වශයෙන් ආකාර කීයකට බෙදා දැක්විය හැකිද.?
I. 4 කි. II. 5 කි. III. 8 කි. IV. 2 කි.

10) පහත සඳහන් බෝග කාණ්ඩ අතරින් ඉඩම්වල සෝදා පාළුව වැළැක්වීමට යොදාගන්නා බෝහ ෘ තෝරන්න.
- I. පියුරේරියා , ඩෙස්මෝඩියම්
- II. තේක්ක , නඳුන්
- III. හණ , කපු
- IV. බඩඉරිඟු , වී

II - කොටස

➢ **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

01) කිසියම් පිළිවෙලකට අනුව සමාන ලක්ෂණ ඇති බෝග එකිනෙක ආසන්නව වගාකර තිබීම එම ස්ථාන නරඹන අයට මෙන්ම ඒවා සංවිධානය කරන අයට පහසුවකි. ඉගෙනීමේ හෝ බෝග වගා පාලනය කිරීමේ පහසුව සඳහා විවිධ බෝග වර්ග කාණ්ඩ කර හෝ වෙන්කර දැක්වීම බෝග වර්ගීකරණය ලෙස හැඳින්වේ.

I. බෝග වර්ගීකරණයේ දී යොදා ගන්නා නිර්ණායක 02 ක් නම් කරන්න. **(ලකුණු 02)**
II. කොළ පොහොර සඳහා යොදාගන්නා ශාක කාණ්ඩ 02 ක් ලියන්න. **(ලකුණු 02)**
III. බෝග වල (වයස අනුව) ජීවන චක්‍රය සම්පූර්ණ කිරීමට ගත වන කාලය බෝග වර්ගීකරණය කොට උදාහරණ 02 බැගින් දක්වන්න. **(ලකුණු 02)**
IV. ඇරිකේසියේ කුලය හා රූටේසියේ කුලය හඳුන්වන වෙනත් නම් 02 ක් ලියන්න. **(ලකුණු 02)**
V. වැඩෙන පරිසරය අනුව බෝග වර්ගීකරණයේදී ශුෂ්ක පරිසරයේ වැවෙන බෝග වර්ග 02 ක් ලියන්න. **(ලකුණු 02)**
VI. ශාක වල උද්භිත විද්‍යාත්මක ලක්ෂණ 02 ක් නම් කරන්න. **(ලකුණු 02)**
VII. විද්‍යාත්මක බෝග වර්ගීකරණයේදී බෝගයක් හැඳින්වීමට පද 02 ක් යොදාගනී.එම පද 02 නම් කරන්න. **(ලකුණු 02)**
VIII. උඩරට වැවෙන පිටරටට අපනයනය කරන බෝග වර්ග දෙකක් ලියන්න. **(ලකුණු 02)**
IX. ද්විපද නාමකරණය ලෙස හඳුන්වන්නේ කුමක්ද.? **(ලකුණු 02)**
X. ශ්‍රී ලංකාවේ ප්‍රධාන උද්භිත උද්‍යානය පිහිටා ඇති දිස්ත්‍රික්කය නම් කරන්න. **(ලකුණු 02)**

02)

I. සීනි නිස්සාරක බෝග වර්ග 02 ක් නම් කරන්න. **(ලකුණු 02)**
II. කෙඳි බෝග ලෙස හඳුන්වන බෝග කාණ්ඩ 02 ක් ලියන්න. **(ලකුණු 03)**
III. අඹ,කජු යන බෝග කාණ්ඩ අයත් වන ශාක කුලය නම් කරන්න. **(ලකුණු 04)**
IV. බිම් සැකසීමේදී බෝග වර්ගීකරණය වැදගත් වන්නේ කෙසේදැයි විස්තර කරන්න. **(ලකුණු 06)**

03) පහත සඳහන් බෝග වර්ග පාසල් ගෙවත්තේදී සිසුන් විසින් හඳුනාගන්නා ලදී.

A - ඉදල් ඉරිඟු	B - දඹල	C - අර්තාපල්	D - තක්කාලි	E - බතල	F - මඤ්ඤොක්කා
G - මැකරල්	H - පොල්	I - අබ	J - ඉඟුරු	K - කිරි අල	L - රටල

I. A B E H යන බෝග අයත් ශාක කුල නම් කරන්න. **(ලකුණු 06)**
II. මෙම බෝග අතරින් මූල පද්ධතියේ නයිට්‍රජන් තිර කරන බැක්ටීරියා අඩංගු බෝග වර්ග දෙකක් ලියන්න. **(ලකුණු 03)**
III. මෙම බෝග අතරින් පස බුරුල් වීම සඳහා වගා කරන බෝග වර්ග දෙකක් ලියන්න. **(ලකුණු 03)**
IV. ඉහත බෝග අතරින් තන්තු මූල පද්ධතියක් ඇති බෝග වර්ග දෙකක් ලියන්න. **(ලකුණු 03)**

04)

I. බෝග වර්ගීකරණය යන්න හඳුන්වන්න. **(ලකුණු 03)**
II. ශාකවල වර්ධන විලාසය අනුව බෝග වර්ගීකරණය කොට උදාහරණ 02 බැගින් දක්වන්න. **(ලකුණු 06)**
III. බෝග වර්ගීකරණයේ වැදගත්කම් හතරක් දක්වන්න. **(ලකුණු 04)**
ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 02)**

05)

I. කුකුබිටේසියේ කුලයට අයත් බෝග වර්ග දෙකක් නම් කරන්න. **(ලකුණු 01)**
II. එකම කුලයේ බෝග වර්ග එකිනෙකට ආසන්නව වගා කිරීමෙන් හෝ එකම භූමියේ නැවත නැවත වගා කිරීමෙන් ඇතිවන හානිය කුමක්ද.? **(ලකුණු 02)**
III. ශාක බද්ධය සඳහා ශාක කුල වැදගත් වන්නේ කෙසේදැයි කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 03)**
IV. පහත සඳහන් බෝග වර්ග ශාක කුලය,පරිසරය හා වයස අනුව වර්ගීකරණය කොට දක්වන්න. **(ලකුණු 09)**

a. - බෝංචි **b.** - කංකුං
c. - වී **d.** - මිරිස්
e. - ඉන්නල **f.** - සුදුළූණු

ඒකකය - බිම් සැකසීම

ගුරුභවතාගේ නම : ජේ.ජී. විමලාවතී - අම්/දිවුලාන විද්‍යාලය

කාර්ය පත්‍රිකා අංක 05

I - කොටස

➢ **01 සිට 10 දක්වා වූ ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

01) බිම් සැකසීමේ පියවර ප්‍රධාන වශයෙන් කොටස් කීයකට බෙදේද.?
I. 4 කි. II. 5 කි. III. 2 කි. IV. 3 කි.

02) අතුරුයත්ගෑම යනු,
I. මූලික වශයෙන් පස පෙරළීමයි
II. පාත්ති සැකසීමයි.
III. ද්විතියික බිම් සැකසීමයි.
IV. බෝගයක් සිටුවීමෙන් පසු පස සම්බන්ධව කරන ලද ක්‍රියාකරකමය.

03) මහා පරිමාණ වගා වලදී ඇලි සහ වැටි දැමීම සඳහා භාවිතා කරන උපකරණය වන්නේ,
I. රිජරය II. තුන් පුරුක් කල්ටිවේටරය
III. ජපන් රොටරි වීඩරය IV. අත් ඉස්කෝප්පය

04) බඩ ඉරිඟු,සෝයා බෝංචි, මුං,තල කව්පි වැනි බීජ සිටුවීම සඳහා යොදා ගන්නා බීජ වප්කරය වන්නේ,
I. මඩ බීජ වප්කරය II. රොටරි වීඩරය
III. FMRC ගොඩ බීජ වප්කරය IV. FMRC මඩ බීජ වප්කරය

➢ **පහත සඳහන් වගුව ඇසුරෙන් 05 - 07 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - තැටි නඟුල	B - උදැල්ල	C - පා මුල්ලව	D - ගැමි ලී නඟුල
E - අත් මුල්ලුව	F - කොකු නඟුල	G - රොටරි වීඩරය	H - රොටවේටරය

05) මෙම උපකරණ අතුරින් ගල් මුල් සහිත ඉඩමක පස පෙරළීම සඳහා යොදාගන්නා උපකරණය වන්නේ,
I. A ය. II. F ය. III. H ය. IV. D ය.

06) මෙම උපකරණ අතුරින් ප්‍රාථමික බිම් සැකසීමට යොදා නොගන්නේ කුමන උප්කරණයද.?
I. A ය. II. B ය. III. C ය. IV. E ය.

07) ඉහත උපකරණ අතුරින් ද්විතියික බිම් සැකසීම සඳහා යොදාගන්නා භ්‍රමණ පෝරුව හඳුන්වන වෙනත් නම:
I. කොකු නඟුල II. රොටවේටරය III. රොටරි වීඩරය IV. පා මුල්ලුව

08) බීජ තවාන් කර ලබාගත් පැළ සිටු වීම සඳහා යොදා නොගන්නා ක්‍රමයකි.
I. සමචතුරස්‍ර ක්‍රමය II. ත්‍රිකෝණ ක්‍රමය
III. පඟේ බෙදුම් ක්‍රමය IV. අහඹු ලෙස වැපිරීම

09)



මෙම රූපයේ සඳහන් උපකරණ යොදාගන්නේ,
I. ප්‍රාථමික බිම් සැකසීමටය. II. ද්විතියික බිම් සැකසීමට
III. මූලික බිම් සැකසීමටය. IV. අතුරුයත්ගෑමටය.

10) පහත සඳහන් උපකරණ අතරින් සත්ත්ව බලයෙන් ක්‍රියාකරන උපකරණය නොවන්නේ,
I. ජපන් රොටරි වීඩරය II. දේශීය ගැමි නඟුල
III. ඇණ දත් පෝරුව IV. සැහැල්ලු යකඩ නඟුල

II - කොටස

➢ **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

01)

I. මූලික බිම් සැකසීම යන්න හඳුන්වන්න. **(ලකුණු 02)**
II. මූලික බිම් සැකසීමේ පියවර දෙකක් නම් කරන්න. **(ලකුණු 02)**
III. ඔබ හඳුනාගෙන ඇති පාත්ති වර්ග දෙකක් නම් කරන්න. **(ලකුණු 02)**
IV. තනි වගා වළවල් වල සිටුවනු ලබන බෝග වර්ග හතරක් නම් කරන්න. **(ලකුණු 02)**
V. උස් වූ පාත්තියක දිග පළල උස හා වගාකරන බෝගයක් දක්වන්න. **(ලකුණු 02)**
VI. බිම් සැකසීමේ උපකරණ ආකාර දෙකකට වර්ගීකරණය කළ හැකිය.එම ආකාර දෙක නම් කරන්න. **(ලකුණු 02)**
VII. වර්තමානය වන විට භාවිතයෙන් ඉවතට යමින් පවතිනනඟුල් වර්ග දෙකක් ලියන්න. **(ලකුණු 02)**
VIII. බෝග සංස්ථාපන උපකරණ භාවිතයෙන් ගතවන කාලය හා ශ්‍රමය අඩු කරගත හැකිය.එසේම බෝග සංස්ථාපන උපකරණ ප්‍රධාන ආකාර දෙකකි.නම් කරන්න. **(ලකුණු 02)**
IX. බෝග වගාවේදී අහඹු ලෙස වපුරන බෝග වර්ග දෙකක් නම් කරන්න. **(ලකුණු 02)**
X. පොල් වගාවේදි තනි වගා වලවල් සකස් කරන විටදී යොදාගන්නා වලේ ප්‍රමාණය දක්වන්න. **(ලකුණු 02)**

02) පහත සඳහන් රූපසටහන ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



I. මෙම උපකරණය ක්‍රියාකරන බලය කුමක්ද.? **(ලකුණු 02)**
II. මෙම උපකරණය යොදාගන්නේ බිම් සැකසීමේ කුමන පියවරේදීද.? **(ලකුණු 02)**
III. මෙම උපකරණයේ නම කුමක්ද.? **(ලකුණු 02)**
IV. මෙම උපකරණය ක්‍රියාකරවන බලය යොදාගෙන ක්‍රියාකරවිය හැකි වෙනත් උපකරණ හතරක් නම් කරන්න. **(ලකුණු 06)**
V. මෙම උපකරණය භාවිතයෙන් ඇති වාසියක් හා අවාසියක් ලියන්න. **(ලකුණු 03)**

03)

I. බිම් සැකසීම යන්න හඳුන්වන්න. **(ලකුණු 02)**
II. තනි වගා වලක් සකසන ආකාරය (රූපසටහන් සහිතව) කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 06)**
III. බිම් සැකසීමේ අරමුණු පහක් ලියා දක්වන්න. **(ලකුණු 05)**
ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 02)**

04)

I. බෝග වගාවේදී යොදා ගන්නා බිම් සකසන උපකරණයක රූපසටහනක් ඇඳ කොටස් නම් කරන්න. **(ලකුණු 04)**
II. නිවැරදි ලෙස බිම් සැකසීම මඟින් පසේ දියුණු වන භෞතික ගුණාංග 02 ක් ලියාදක්වන්න. **(ලකුණු 04)**
III. බෝග සංස්ථාපනය කිරීමේදී නිවැරදි ගැඹුර සහ පරතරය භාවිත කිරීමෙන් අත්වන ප්‍රයෝජන හතරක් දක්වන්න. **(ලකුණු 04)**
ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 03)**

05)

I. බිම් සකසන උපකරණ අතරින් බහු කාර්යය උපකරණය කුමක්ද.? **(ලකුණු $01\ ^1/_2$)**
II. බිම් සැකසීමේ උපකරණ යොදනු ලබන බලය අනුව වර්ගීකරණය කොට උදාහරණය බැගින් දක්වන්න. **(ලකුණු 03)**
III. අතුරුයත්ගැමේදී පසට කරනු ලබන ක්‍රියාකරකම් තුනක් ලියන්න. **(ලකුණු $04\ ^1/_2$)**
IV. බෝග සංස්ථාපනය කරන පහත සඳහන් එක් එක් ක්‍රමයන් පිළිබඳ ව දළ සැලැස්ම ඉදිරිපත් කරන්න. **(ලකුණු 06)**

a. - ත්‍රිකෝණ ක්‍රමය
b. - සමචතුරස්‍ර ක්‍රමය
c. - පෙළේ බෙදුම් ක්‍රමය

ඒකකය - උස් බිම් බෝග සඳහා තවාන් ශිල්ප ක්‍රම

ගුරුභවතාගේ නම : බී.එම්.මාධව ප්‍රමිත් - අම්/නාමල්තලාව මහා විද්‍යාලය

කාර්ය පත්‍රිකා අංක 06

බහුවරණ ප්‍රශ්න

1. තවාන් දමා ක්ෂේත්‍රයේ පැළ සිටුවීම සිදු කරන බීජ පැළ කාණ්ඩය වන්නේ,

 1.මිරිස්,බණ්ඩක්කා සහ කුරක්කන් 2.අබ,බටු, සහ මෑ

 3.මිරිස්,බටු සහ තක්කාලි 4.රාබු,තක්කාලි සහ බණ්ඩක්කා

2. රසායනික පාංශු දිලීර නාශකයක් වන්නේ,

 1.අළු 2.පිදුරු 3.තිරාම් 4.ඇල්බට් ද්‍රාවණය

3. උස් වූ පාත්ති සැකසීම,වඩාත් සුදුසු වන බෝගයක් වන්නේ,

 1.කංකුං 2.තක්කාලි 3.දඹල 4.ගෝවා

4. බීජ හෝ වර්ධක කොටසක් සිටුවා පැළයේ වර්ධනයට හිතකර පරිසරයක් ලබාදෙමින් ක්ෂේත්‍රයේ සිටුවන තෙක් රැකබලා ගන්නා ස්ථානය හඳුන්වන්නේ,

 1.පාත්තියක් ලෙස 2.තවානක් ලෙස
 3.නිපර්ාංශු වගාවක් ලෙස 4.වගා කුළුණක් ලෙස

5. වී වගාවේදී පැළ සිටුවීමේ යන්ත්‍රය භාවිත කර පැළ සිටුවීමට භාවිතා කරන තවාන් වගර්ය වන්නේ,

 1.මඩ තවාන් 2.ඩැපොග් තවාන් 3.පෙට්ටි තවාන් 4.තැටි තවාන්

6. තවාන් පැළවලට බහුලව වැළදෙන දිලීර රෝගයක් වන්නේ,

 1.ඇන්ත්‍රැක්නෝස් 2.හිටු මැරීම
 3.දියමලං කෑම 4.පත්‍ර විචිත්‍ර රෝගය

7. උදුරා සිටුවීමට ඔරොත්තු නොදෙන බීජ තවාන් කිරීමට යෝග්‍ය තවාන් වගර්ය වන්නේ,

 1.උස් තවාන් 2.ගිල්වූ තවාන්
 3.සමූහ බඳුන් තවාන් 4.නොරිදෝකෝ තවාන්

8. තවාන් පැළවළ වර්ධනය දුවර්ල වීම හා පත්‍ර කහ පැහැ වීම දක්නට ලැබුණි නම්,එයට දැමිය යුතු වන්නේ,

 1.තනුක යූරියා ද්‍රාවණයකි. 2.තනුක කැල්සියම් කාබනේට් ද්‍රාවණයකි.
 2.තනුක පොටෑසියම් සල්ෆේට් ද්‍රාවණයකි. 4.තනුක සුපර් පොස්පේට් ද්‍රාවණයකි.

9. බීජ තවාන් කර ලබාගත් පැළ,ක්ෂේත්‍රයේ සිටුවීම කරනු ලබන බෝග කිහිපයකි,

1.බෝංචි,දඹල හා කැකිරි. 2.තක්කාලි,ගෝවා හා සලාද
3.කරවිල,වැටකොළු හා පතෝල. 3.මිරිස්,කැරට් හා රාබු

10. මූල මණ්ඩලයට හානි නොවන ලෙස පැළ ලබාගැනීමට වඩා සුදුසුම තවාන් ක්‍රමය වන්නේ,

1.උස් තවාන් 2.ගිල්වූ තවාන්
3.බඳුන් තවාන් 4.නොරිදෝකෝ තවාන්

රචනා ප්‍රශ්න

1. A. තවානක් යන්න හඳුන්වන්න?
B. තවාන්වල අවශ්‍යතා 5ක් ලියන්න?
C. තවාන් සැකසීමේ පියවර අනුපිළිවෙළින් ලියන්න?
D. තවානක් සඳහා සුදුසු ස්ථානයක් තේරීමේදී සැළකිලිමත් විය යුතු කරුණු 5ක් ලියන්න?

2. A. තවාන් සැකසීමේදී තවාන් මිශ්‍රණය නමින් හඳුන්වනු ලබන විශේෂිත මාධ්‍යක් භාවිතා කෙරෙයි.එය සකසන ආකාරය ලියන්න?
B. විවිධ ආකාරයේ තවාන් වගර් භාවිතයේ පවතී.එවැනි තවාන් වගර් පහක් හඳුනාගෙන නම් කරන්න?
C. උස් වූ පාත්තියක් යනු කුමක්දැයි පැහැදිලි කරන්න?
D. උස් වූ පාත්තියක රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න?

3. A. ගිල්වූ පාත්තියක් යන්න හඳුන්වන්න?
B. තවාන් මිශ්‍රණයක තෙතමන තත්වය පරික්ෂා කිරීම සඳහා සිදුකළ හැකි සරල පරීක්ෂණය කුමක්ද?
C. නොරිදෝකෝ තවානක් යන්න හඳුන්වන්න?
D. නොරිදෝකෝ තවාන් සැකසීම පියවර වශයෙන් ලියා දක්වන්න?

4. A. නොරිදෝකෝ තවානක වගා කළ හැකි බෝග වගර් පහක් නම් කරන්න?
B. බඳුන් තවාන් සඳහා යොදාගත හැකි බඳුන් පහක් නම් කරන්න?
C. තැටි තවාන් තුළ වගාකළ හැකි බෝග පහක් නම්කරන්න?
D. තවාන් ජීවාණුහරණය යන්න හඳුන්වන්න?

5. A. තවාන් ජීවාණුහරණ ක්‍රම හතරක් නම් කරන්න?
B.උණු ජලය මගින් තවාන් ජීවාණුහරණය කරන ආකාරය ලියා දක්වන්න?
C. රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් තවාන් ජීවාණුහරණය කරන ආකාරය ලියා දක්වන්න?
D. තවාන් නඩත්තු කිරීමේදී සිදුකළ යුතු ක්‍රියාවලි හතරක් නම් කරන්න?

ඒකකය - බෝග වගාවේ ජල කළමනාකරණය

ගුරුභවතාගේ නම : බී.එම්.මාධව ප්‍රමිත් - අම්/නාමල්තලාව මහා විද්‍යාලය

කාර්ය පත්‍රිකා අංක 07

බහුවරණ ප්‍රශ්ණ

1. පසේ ඇති ජලය හානි වන ආකාර නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරා දක්වන්න?

   1. වාෂ්පීකරණය,ගැඹුරු වැස්සීම,ජලවහනය
   2. මතුපිට අපදාවය,උත්ස්වේදනය,වාෂ්පීකරණය
   3. ආසුෑතිය,ගැඹුරු වැස්සීම,ජලවහනය
   4. මතුපිට අපදාවය,ආසුෑතිය,උත්ස්වේදනය

2. බහුලව වැසි ජල ටැංකි කෙරෙන ප්‍රදේශයකි,

   1. නුවර එළිය
   2. අනුරාධපුරය
   3. කළුතර
   4. රත්නපුර

3. ජල අවශ්‍යතාවය වැඩි ජලසම්පාදන ක්‍රමයක් වන්නේ,

   1. බේසම් ජලසම්පාදනයයි
   2. පිටාර ජල සම්පාදනයයි
   3. බිංදු ජල සම්පාදනයයි
   4. වළලු ජලසම්පාදනයයි

4. ජලසම්පාදනය සමගම පොහොර යෙදීම ද කළ හැකිජල සම්පාදන ක්‍රමයක් වන්නේ,

   1. පිටාර ජලසම්පාදනයයි
   2. බිංදු ජලසම්පාදනයයි
   3. කළ ගෙඩි ජලසම්පාදනයයි
   4. වළලු ජලසම්පාදනයයි

5. ඉතා කායර්ක්ෂම ජල සම්පාදන ක්‍රමයකි,

   1. ඉසින ජලසම්පාදනය
   2. පිටාර ජලසම්පාදනය
   3. බිංදු ජලසම්පාදනය
   4. බේසම් ජලසම්පාදනය

6. පිටාර ජලසම්පාදනයේ වාසියක් වන්නේ,

   1. වැඩි ජල ප්‍රමාණයක් අවශ්‍ය වීම ය.
   2. මූලික වියදම අඩුවීම ය.
   3. පස මඩ වීමෙන් උපකරණ භාවිතය අපහසු වීම ය.
   4. වාෂ්පීකරණයෙන් ජලය අපතේයාම ය.

7. ඉසින ජලසම්පාදන ක්‍රමයේ අවාසියක් වන්නේ,

   1. පාංශු ඛාදනය සිදු නොවීම ය.
   2. ජලසම්පාදන කායර්ක්ෂමතාව වැඩි වීම ය.
   3. බෑවුම් සහිත භූමිවලට ද සුදුසු වීමය.
   4. බෝගවල පරාගනයට බාධා විය හැකි වීමය.

8. පිටාර ජලසම්පාදනය හා බේසම් ජලසම්පාදනය යොදා ගත හැකි බෝග වන්නේ පිළිවෙළින්,
1. පොල් හා වී 2.වී හා රඹුටන් 3. රඹුටන් හා කෙසෙල් 4.මිදි හා මුං

9. බෑවුම් සහිත ඉඩම්වලට යොදා ගත හැකි ජලසම්පාදන ක්‍රමයක් වන්නේ,

1. ඉසින ජලසම්පාදනය 2.මැටි කළ වැළලීම
3. බේසම් ජලසම්පාදනය 4.පිටාර ජලසම්පාදනයයි

10. බිංදු ජලසම්පාදනයේදී බෝගයේ මූල මණ්ඩලය ආසන්නයට ජලය බිංදු ලෙස වැස්සීම සඳහා කුඩා නළවලට සවි කරනු ලබන්නේ,

1. නැසින්න 2. විමෝචකය 3.වැල්වය 4. කන්ඩියුට් බටය

රචනා ප්‍රශ්ණ

1) A. බෝග වගාවේදී ජල කළමණාකරණය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද?
B. බෝග වගාවට ජලයේ ඇති වැදගත්කම කරුණු හයකින් දක්වන්න?
C. බෝග වගාවේ ජල කළමණාකරණයේ ප්‍රධාන උපාය මාගර් තුනක් ලියන්න?
D. පාංශු ජල සංරක්ෂණයේදි පසෙන් ජලය ඉවත් වන ක්‍රම තුනක් ඇත.එම ක්‍රම තුන පැහැදිලි කරන්න?

2) A. පසෙන් ජලය ඉවත් කිරීම අවම කිරීම සඳහා පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතා කරයි.එලෙස භාවිතා කරන පාංශු සංරක්ෂණ ක්‍රම හතරක් ලියා දක්වන්න්?
B. පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීමේ වාසි මොනවාද?
C.පසට යොදන වසුන් ස්වාභාවික හා කෘතීම ලෙස ආකාර දෙකකි.ඒවාට උදාහරණ ලියා දක්වන්න?
D.බෝග වගාවේදී ජල සම්පාදනය ලෙස හඳුන්වන්නේ කුමක්ද?

3) A. බෝග වලට ජලය සම්පාදනය කිරීමේදි සැලකිය යුතු කරුණු කිහිපයකි.එවැනි කරුණු හතරක් ලියා දක්වන්න?
B. පහත සඳහන් භූ තල ජල සම්පාදන ක්‍රම පැහැදිලි කර ඒවායේ වාසි හා අවාසි දෙක බැගින් ලියා දක්වන්න?
- පිටාර ජලසම්පාදනය
- ඇළි වැටි ජලසම්පාදනය
- තීරු ජලසම්පාදනය
- බේසම් ජලසම්පාදනය
- වළලු ජලසම්පාදනය

C. විසිරි ජලසම්පාදනය යනු කුමක්දැයි රූප සටහන් ඇසුරින් පැහැදිලි කර එහි වාසි හා අවාසියක් බැගින් ලියා දක්වන්න?
D. පහත සඳහන් පද පැහැදිලි කරන්න?
- පසක ක්ෂේත්‍ර ධාරිතාව
- තාවකාලික මැලවීමේ අංකය
- ස්ථිර මැලවීමේ අංකය

ඒකකය - ශාක පෝෂක කළමනාකරණය තුලින් බෝග අස්වනු වැඩි කිරීමට දායක වෙයි.

ගුරුභවතාගේ නම : ඩබ්.එම්.ඩබ්.පී. අභයතිස්ස - අම්/උහන තිස්සපුර විද්‍යාලය

කාර්ය පත්‍රිකා අංක 08

I කොටස

- අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු වලින් නිවරදි හා වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

01 . බෝග වලට යොදන රසායනික පොහොර වලින් වැඩි ප්‍රයෝජනයක් ලබා ගත හැකි වනුයේ ඒවා,

1. පස අධික ලෙස වියලි විට යෙදීමෙනි.
2. තද වර්ෂාව ඇති කාලයක යෙදීමෙනි.
3. පසෙහි කාබනික ද්‍රව්‍ය අඩු අවස්ථා වල යෙදීමෙනි.
4. පස මදක් තෙත්ව ඇති විට යෙදීමෙනි.

02. අත්‍යවශ්‍ය ශාක පෝෂකවලින් මහා පෝෂක කාණ්ඩය වනුයේ,

1. පොටෑසියම්,කැල්සියම්,මැංගනීස්.
2. මැංගනීසියම්,නයිට්‍රජන්,සල්පර්
3. නයිට්‍රජන්,පොස්පරස්,බෝරෝන්.
4. කාබන්,ඔක්සිජන්,කොපර්.

03. මිරිස් වගාවක සමහර ශාක වල මේරු පත්‍ර දම් පැහැයට හැරී වර්ධනය බාල වී ඇති බව දක්නට ලැබුණි.මෙම තත්වයට හේතු විය හැක්කේ,

1. නයිට්‍රජන් ඌනතාවයයි.
2. මැංගනීසියම් ඌනතාවයයි.
3. පොස්පරස් ඌනතාවයයි.
4. ජලය අධික වීමයි.

04. පූර්ණ පොහොර මිශ්‍රණයක් යනු,

1. ප්‍රධාන ශාක පෝෂක තුනම අඩංගු පොහොර මිශ්‍රණ වේ.
2. ප්‍රධාන ශාක පෝෂක දෙකක් අඩංගු පොහොර මිශ්‍රණ වේ.
3. ක්ෂුද්‍ර පෝෂක අඩංගු පොහොර මිශ්‍රණ වේ.
4. ප්‍රධාන ශාක පෝෂක එකක් අඩංගු පොහොර මිශ්‍රණ වේ.

05. ගොවියෙක් තම බෝග වගාවට යෙදීමට සුදු පැහැති ගෝලාකාර ජලයේ ඉතා හොඳින් දියවෙන රසායනික පොහොර වර්ගයක් භාවිතා කරයි.මෙම පොහොර වර්ගය විය හැක්කේ,

1. මියුරියේට් ඔෆ් පොටෑෂ්.
2. රොක් පොස්පේට්.
3. යූරියා.
4. ඇමෝනියම් සල්පේට්.

06. නාගරික ඉඩම් සඳහා භාවිතා කළ හැකි වඩාත් සුදුසු කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රමයක් වනුයේ,

1. වල ක්‍රමය. 2. බැරල් ක්‍රමය. 3. ග්‍රිඩ් අයන් ක්‍රමය. 4. ගොඩ ක්‍රමය.

07. බෝග වලට පොහොර යෙදීමේදී පැල අවට පොහොර යෙදීම සිදු කරනු ලබන්නේ,

1. වී,බඩ ඉරිඟු,කවුපි.
2. පොල්,රබර්,කෙසෙල්.
2. අන්නාසි, බඩ ඉරිඟු,වී.
4. රබර්,කවුපි,වී.

08. කාබනික පොහොර භාවිතයේදී වාසියකි,

1. ගබඩා කර තැබීම පහසු වීම.
2. යෙදීමේ කම්කරු වියදම අඩුය.
3. පසේ ක්ෂුද්‍ර ජීවී ගහනය වැඩි කරයි.
4. අඩු කාලයකින් පෝෂක නිදහස් කරයි.

09. බෝග වගාවේදී ත්‍රිත්ව සුපර්පොස්පේට් පොහොර බහුලව යොදා ගැනේ.මෙම පොහොර වර්ගයේ අඩංගු පොස්පරස් (P_2O_2) ප්‍රතිශතය,

1. 45% කි. 2. 60% කි. 3. 27% කි. 4. 46% කි.

10. ගොඩ ක්‍රමයට කොම්පෝස්ට් සකස් කිරීමේදී පළමු පෙරළීම සිදු කරනුයේ ගොඩ ගසා,

1. සති දෙකකට පසු. 2. මාස දෙකකට පසු. 3. සති තුනකට පසු. 4. මාසයකට පසු.

II කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. ශාකයක පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය ශාක පෝෂක අනිවාර්යයෙන්ම තිබිය යුතු වේ.

    I. ශාක පෝෂණය යනු කුමක්ද?
    II. අත්‍යවශ්‍ය ශාක පෝෂක මහා පෝෂක සහ ක්ෂුද්‍ර පෝෂක ලෙස වෙන් කර දක්වන්න.
    III. ශාක වල පහත දැක්වෙන කාර්යයන් සඳහා වඩාත්ම වැදගත්වන මහා පෝෂකය ලියන්න.

        A. ශාක වර්ධනයට
        B. මූල මණ්ඩලයේ වර්ධනයට
        C. පුෂ්පිකරණයට

02. බෝග වගාවේදී අස්වනු ලෙස පෝෂක පසෙන් ඉවත්ව යන විට ඒවා නැවත ලබා දීමට කාබනික පොහොරද භාවිතා කළ හැකිය.

    I. කාබනික පොහොර යන්න කෙටියෙන් හඳුන්වන්න.
    II. කොළ පොහොර ලෙස යොදා ගත හැකි රභිල ශාක තුනක් නම් කරන්න.
    III. වගාවට බහුලව භාවිතා කරන සත්ව පොහොර වර්ග තුනක් ලියන්න.

03. ප්‍රදේශයේ සුලබව පවතින සත්ව හා ශාක කොටස් භාවිතා කරමින් කොම්පෝස්ට් නිපදවීම සිදු කරයි.

    I. කොම්පෝස්ට් පොහොර යනු කුමක්ද?
    II. කොම්පෝස්ට් පොහොර සකස් කිරීමට යොදා ගන්නා අමු ද්‍රව්‍ය නම් කරන්න.
    III. කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රම හතරක් නම් කරන්න.

04.
    I. පොහොර භාවිත කාර්යක්ෂමතාවය හඳුන්වන්න.
    II. පොහොර භාවිත කාර්යක්ෂමතාවය ඉහල නැංවීමට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?
    III. ඒකාබද්ධ ශාක පෝෂක කළමණාකරනය අර්ථ දක්වන්න.

05.
    I. බෝගවලට පොහොර යොදන විවිධ අවස්ථා කෙටියෙන් පැහැදිලි කරන්න.
    II. පසට පොහොර යොදන ක්‍රම තුනක් නම් කරන්න.
    III. පූර්ණ පොහොර මිශ්‍රණයක් සහ අර්ධ පොහොර මිශ්‍රණයක අතර ඇති වෙනස ලියන්න.

06. පහත වගුව පූරවන්න.

පොහොර වර්ගය	වර්ණය	ස්වරූපය	අඩංගු පෝෂකය සහ ප්‍රතිශතය
යූරියා			
ඇමෝනියම් සල්ෆේට්			
රොක්පොස්පේට්			
මියුරියේට් ඔෆ් පොටෑෂ්			

ඒකකය - පළිබෝධ පාලනය

ගුරුභවතාගේ නම : එස්.කේ. කිණිගම - අම්/උදයගිරිය විද්‍යාලය

කාර්ය පත්‍රිකා අංක 09

1) ජීවන චක්‍රයේ කීට හා සුහුඹුල් අවස්ථා දෙකම බෝගයට හානිදායක වන කෘමි පළිබෝධකයෙකු වනුයේ,
   i) අවුලකපෝරා කුරුමිණියා.
   ii) රයිනෝසිරස් කුරුමිණියා.
   iii) කොලහකුලන දළඹුවා.
   iv) ගොයම් පුරුක් පණුවා

2) ක්ෂේත්‍රයේදී මැළවීමට ලක්ව තිබූ තක්කාලි ශාකයක කඳ කපා ජල බඳුනකට දැමූ විට කැපුම් පෘෂ්ඨයෙන් උකු තරලයක් වැස්සෙනු දක්නට ලැබුණි.මෙම රෝගී තත්වයට හේතුකාරකය විය හැක්කේ,
   i) දිලීරයකි
   ii) බැක්ටීරියාවකි
   iii) වටපණුවෙකි
   iv) වයිරසයකි

3) එළවළුවලට හා පලතුරු වලට " ඇන්ත්‍රැක්නෝස් " රෝගය වැළඳීමට හේතු වන රෝග කාරක දිලීරය වනුයේ
   i) පියුසේරියම්
   ii) රයිසොක්ටෝනියා
   iii) පීතියම්
   iv) වයිරසයකි

4) බණ්ඩක්කා පත්‍ර විචිත්‍ර රෝගය පාලනය කිරීමට යොදාගත හැකි ක්‍රමය නම්,
   i) දිලීර නාශක යෙදීමයි
   ii) බීජ ප්‍රතිකාර ක්‍රමයයි
   iii) වාහක කෘමීන් පාලනයයි
   iv) පාංශු ජීවානුහරණයයි

5) වම්බටු ශාක පත්‍රවල දැලක් ආකාරයට ඉතිරිවන සේ පත්‍ර කා දමන කෘමියා වන්නේ
   i) අවුලකපෝරා
   ii) ඉල් මැස්සා
   iii) එපිලැක්නා
   iv) පලතුරු මැස්සා

6) බීජ සිටුවීමට පෙර තවාන් මාධ්‍යය ජීවානුහරණය කිරීමෙන් අපේක්ෂා කරනුයේ,
   i) බීජ ප්‍රරෝහණය ඉක්මන් කිරීමයි
   ii) පළිබෝධ හානි පාලනය කිරීමයි
   iii) පසේ ජලවහනය දියුණු කිරීමයි
   iv) ශාක පෝෂක සුලබතාව වැඩි කිරීමයි

7) භූගත කඳන් සහිත අටවරා,කළාදුරු ආදී වල් පැළ පාලනයට යෙදිය යුතු වල්නාශක වගර්ය කුමක්ද?
   i) තෝරා නසන වල් ශාක
   ii) ස්පශර් වල් නාශක
   iii) සංස්ථානික වල් නාශක
   iv) සියල්ල නසන වල් නාශක

8) බෝග වගරීකරණය හා පලිබෝධ පාලනය අතර සම්බන්ධතාව පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
   a) තක්කාලි වගාවකින් පසු එම භූමියෙහි අතර්ාපල් වගා කිරීමෙන් හිටු මැරීම පාලනය වේ
   b) කුකුබරිටේසියේ කුලයේ බෝග වගාවකින් පසු වෙනත් කුලයකබෝගයක් වගා කිරීමෙන් ඉලමැස්සාගේ හානිය පාලනය කල හැකිය
   c) වී වගා ක්ෂේත්‍රයට තෝරා නසන වල් නාශක යෙදූ විට වී ශාකය ඉතිරිව පළල් පත්‍ර වල් පැළෑටි විනාශ වේ

   ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශ මොනවාද?

   i) A හා B පමණි
   ii) A හා C පමණි
   iii) B හා C පමණි
   iv) A, B හා C සියල්ලම

9) වල් පැළෑටි පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශ තෝරන්න
   a) පළල් පත්‍ර හා වල් පැළෑටි වල ඇත්තේ ජලාකාර නරටි වින්‍යාසයක් සහිත පත්‍රය
   b) තෘණ ශාක වල තන්තුමය මූල පද්ධතියක් ඇත
   c) පලල් පත්‍ර වල් පැළෑටි වල කඳ කුහර සහිතය

   i.A හා B පමණි
   ii.A හා C පමණි
   iii.B හා C පමණි

10) කුකුබිටේසියා කුලයේ බෝග වල එල පොලිතීන් කවර යොදා ආවරණය කිරීමෙන් බලාපොරොත්තු වනුයේ කුමක්ද
   i) ඉල්මැස්සාගේ එල වලට හානි කිරීම
   ii) එල වල විශාලත්වය වැඩි කිරීම
   iii) එල වලට නියමිත වර්‍ණය ලබා දීම
   iv) එල වල සිදු වන ප්‍රභාසංස්ලේශණය වැලැක්වීම

II කොටස

1) කෘෂිකමර්යේදී අපේක්ෂිත අස්වැන්න ලබා ගැනීමට කෘමි පළිබෝධ ජීවන චක්‍ර, ඔවුන්ගේ බෝග වලට සිදුවන හානි පාලනය කරගත හැකි ක්‍රම පිළිබදව අවබෝධයක් තිබීම ඉතා වැදගත්

I) (a) පූර්ණ රූපාන්තරණය සහිත කෘමීන්ගේ ජීවන චක්‍රයේ අවස්ථා සඳහන් කරන්න.

(b) පූර්ණ රූපාන්තරණය පෙන්වන කෘමි පළිබෝධකයන් දෙදෙනෙකු නම් කරන්න

(c) අධර් රූපාන්තරණය පෙන්වන කෘමි පළිබෝධකයින් දෙදෙනෙකු නම් කර හානි කරන බෝගය බැගින් වෙන වෙනම ලියන්න

II) (a) බෝග වලට වයිරස් රෝග බෝ කරන කෘමි පළිබෝධකයින් දෙදෙනෙකු නම් කරන්න

(b)බෝග වලට වයිරස් රෝග වැළදුනු විට පෙන්නුම් කරන රෝග් ලක්ෂණ 04 සඳහන් කරන්න

2) I) (a) කුකුබිටේසියා කුලයේ එලවලට බහුලව හානිකරන කෘමි පළිබෝධකයෙකු නම් කරන්න

(b)එම කෘමියාගෙන් ඉහත එල වලට සිදුවන හානිය පැහැදිලි කරන්න

II) (a)වල් පැළෑටි වල පොදු ලක්ෂණ 04 ක් සඳහන් කරන්න

(b)වල් පැළෑටි වලින් බෝග වගාවට සිදු වන හානි 04 ක් ලියන්න

III) කෙටියෙන් පහැදිලි කරන්න,

a)ආගන්තුක ආක්‍රමණශීලී වල් පැළෑටි b)ස්පශර් වල් නාශක

3) ශාක පෙන්නුම් කරන රෝග ලක්ෂණ අනුව ශක වලට වැළදී ඇති රෝග හඳුනාගත හකිය.

I) (a)බෝග වලට වලදෙන් දිලීර රෝගවල පොදු ලක්ෂන හතරක් අවස්ථා සඳහන් කරන්න

(b) වී වගාවට වැළදෙන දිලීර රෝග දෙකක් නම් කරන්න

II) (a) සොලෙනේසියේ කුලයේ බෝග වලට තවාන් අවථාවේදී බහුලව වැළදෙන රෝගයක් නම් කරන්න

(b)එම රෝගයේ රෝග ලක්ෂණ දෙකක් සඳහන් කරන්න

(c)එම රෝගය වළක්වාගැනීමට ගතහැකි ක්‍රියාමාගර් දෙකක් දක්වන්

ඒකකය - වී වගාව

ගුරුභවතාගේ නම : එස්.ජේ.එම්.සමරනායක - අම්/දමන මහා විද්‍යාලය

කාර්ය පත්‍රිකා අංක 10

01. සහල්වල මනා පෝෂණ අගයක් අන්තර්ගත වී ඇත. සහල් 100g ක ඇති පෝෂ්‍ය පදාර්ථ නිවැරදි ලෙස දක්වා ඇත්තේ,
    1. කාබෝහයිඩ්‍රේට් 77g, ප්‍රෝටීන 8g, මේදය 0.6g, අඩංගු වේ.
    2. ප්‍රෝටීන 10g, කාබෝහයිඩ්‍රේට් 50g, මේදය2.5g, අඩංගු වේ.
    3. කාබෝහයිඩ්‍රේට් 67g, ප්‍රෝටීන 20g, මේදය 5.2g අඩංගු වේ.
    4. කාබෝහයිඩ්‍රේට් 89g, ප්‍රෝටීන 6g, මේදය 5g අඩංගු වේ.
02. ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන්ම වී නිෂ්පාදනය කරන දිස්ත්‍රික්ක ලෙස,
    1. කෑගල්ල, මොනරාගල, වව්නියාව, අම්පාර
    2. අම්පාර, මඩකලපුව, පොළොන්නරුව, කුරුණෑගල
    3. නුවර, මාතර, ගාල්ල, හම්බන්තොට
    4. නුවරඑළිය, අනුරාධපුරය, ගාල්ල, මාතර
03. වී යනු ඒක බීජ පත්‍රී ශාකයක් වන අතර එහි විද්‍යාත්මක නාමය Oryza Sativa වේ. වී ශාකය අයත් කුලය වන්නේ,
    1. ෆැබේසියේ
    2. පොඒසියේ
    3. සොලනේසියේ
    4. රූටේසියේ
04. වී පුෂ්පිකා ද්වි ලිංගික වන අතර 99% ක් ස්වපරාගණය වේ. වී පුෂ්පයේ පරාගණය සිදුවන වෙලාව වන්නේ,
    1. 10.00 පැය හා 14.00 පැය
    2. 11.30 පැය හා 11.00 පැය
    3. 9.00 පැය 15.00 පැය
    4. 8.00 පැය 1.00 පැය
05. වී බීජ ප්‍රරෝහණයේ සිට පුෂ්ප මූලාකෘති ඇති වීම දක්වා කාලය වර්ධක අවධිය ලෙස ද හැඳින් වේ. ඒ අනුව මාස 3 ½ වී ප්‍රභේදයක හා මාස 4 වී ප්‍රභේදයක වර්ධක අවධිය පිළිවෙලින්,
    1. දින 45 - දින 60
    2. දින 30 - දින 45
    3. දින 45 - දින 60
    4. දින 45 - දින 80
06. පාරම්පරික වී ප්‍රභේද ශ්‍රී ලංකාවේ වසර දහස් ගණනක් තිස්සේ වගාකරන ලදුව අදටත් නොනැසී පවතී. පාරම්පරික වී ප්‍රභේද වලට උදාහරණ දැක්වෙන වරණය තෝරන්න.
    1. Bg300,Bw351, සුවදැල්
    2. පොඩි වී, Bg450, රත්දැල්
    3. සුදු සම්බා, Bg3-5, රතු දිග
    4. කලු හීනටි, කුරුලු කුඩු වී, හැටදා වී
07. ශ්‍රී ලංකාවේ මධ්‍යම වී අභිජනන මධ්‍යස්ථානය බතලගොඩ පිහිටුවීමෙන් පසු ගොවීන්ට හඳුන්වා දුන් පළමු දෙමුහුම් වී ප්‍රභේදය වන්නේ,
    1. H 4 වී ප්‍රභේදය
    2. Bg 300 වී ප්‍රභේදය
    3. Bg 450 වී ප්‍රභේදය
    4. Bg 3-5 වී ප්‍රභේදය
08. වී වගාවේ දී තවාන් භාවිතයෙන් වී අස්වැන්නේ ඵලදායීතාව වැඩි කරගත හැකිය. වී වගාය සඳහාම පමණක් භාවිතා කරන තවාන් වර්ගය වන්නේ,
    1. කැටි තවාන්
    2. වැලි තවාන්
    3. නොරිඩෝකෝ තවාන්
    4. ඩාපොග් තවාන්
09. වී වාගාවේදී පැළ සිටුවීම මගින් ලබා ගත හැකි වාසියක් නොවන්නේ,
    1. වල්පැළ පාලනය අපහසුවේ.
    2. අවශ්‍ය බීජ ප්‍රමාණය අඩුය.
    3. සියුම් ව බිම සකස් කිරීම අවශ්‍ය නැත.
    4. අවශ්‍ය ජල ප්‍රමාණය අඩුය.
10. වී වගාව සඳහා භාවිතා කරන ජල සම්පාදන ක්‍රමය වන්නේ,
    1. වළලු ජල සම්පාදනය
    2. තීරු ජල සම්පාදනය
    3. ඇලි හා වැටි ජල සම්පාදනය
    4. පිටාර ජල සම්පාදනය

01) වී වගාව ශ්‍රී ලංකාවට ඉතා වැදගත් වේ. මෙම ප්‍රකාශය තහවුරු කිරීම සඳහා කරුණු 04 ක් ඉදිරිපත් කරන්න.
02) ශ්‍රී ලංකාව තුළ වී වගාව සඳහා ඇති විභවයන් 03ක් ලියන්න.
03) වී ශාකයේ දැකිය හැකි රූපීය ලක්ෂණ 04 ක් ලියා කෙටියෙන් හඳුන්වන්න.
04) ගොයම් පැළයේ දැකිය හැකි අවධි 03 සඳහන් කර එහි කාල වකවානු සඳහන් කරන්න.
05) හරිත විප්ලයට ආරම්භයත් සමඟ ශ්‍රී ලංකාවේ වී අභිජනනය ආරම්භ විය.මෙහිදී සලකා බලන ලද මූලික කරුණු 05ක් ලියන්න.
06) ඔබ කැමති පාරම්පරික හා වැඩි දියුණු කරන ලද වී ප්‍රභේද දෙකක් සඳහන් කර ඒවායේ විශේෂ ලක්ෂණ 03 බැගින් සඳහන් කරන්න.
07) පොදුවේ ගත් විට පාරම්පරික වී ප්‍රෙභ්ද හා වැඩි දියුණු කරන ලද වී ප්‍රභේද වල දැකිය හැකි ලක්ෂණ 05 බැගින් වගුගත කරන්න.
08) වැඩි දියුණු කළ වී ප්‍රභේද වගා කිරීමේ දී ගොවියාට ඇතිවන ගැටලු 03 ක් ලියන්න.
09) වී වගාවට අවශ්‍ය පාරිසරික සාධක 04 සඳහන් කරන්න.
10) වී වගාවේදී බිම් සකස් කිරීමට පෙර නියර බැඳ ඇල වේලි පිරිසිදු කළ යුතුය. මෙය වනාත එළි කිරීම ලෙස හඳුන්වයි. ඉන් පසු බිම් සැකසීම පියවර 03 කින් සිදු කරයි. එම පියවර සඳහන් කරන්න.
11) ක්ෂේත්‍ර සංස්ථාපනය යනු වී බෝගය ක්ෂේත්‍රයේ පිහිටුවීමයි. මෙහි ආකාර කිහිපයකි. එම ආකාර සඳහන් කරන්න.
12) සංස්ථාපනය සඳහා යොදාගන්නා වී බිත්තර වී ලෙස හැදින්වේ. බිත්තර වී වල පැවතිය යුතු ප්‍රමිතීන් සඳහන් කරන්න.
13) සංස්ථාපනය සඳහා බිත්තර වී පැළ කිරීම (බීජෞෂණය) කෙටියෙන් විස්තර කරන්න.
14) වී වගාවේ දී භාවිතා කරන වැපිරීම හා පැළ සිටුවීම අතර වෙනස්කම් වගු ගත කරන්න.
15) වී බෝගය ක්ෂේත්‍රයේ සංස්ථාපනයෙන් පසු කළ යුතු පශ්චාත් සාත්තුව සඳහන් කරන්න.
16) කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීමටත් රසායනික පොහොර භාවිතය අවම කිරීමටත් කෘෂි විද්‍යාඥයින්ගේ අවධානය යොමු වී ඇත. වී වගාව සඳහා භාවිත කළ හැකි කාබනික පොහොර වර්ග 06 ක් සඳහන් කරන්න.
17) වී වගාවට රසායනික පොහොර භාවිතයේ දී අවධානය යොමු කළ යුතු කරුණු 05 ක් සඳහන් කරන්න.
18) වී වගාව සඳහා පොහොර නිර්දේශය 2013 - හි ප්‍රධාන අරමුණු 03 සඳහන් කරන්න.
19) නව පොහොර නිර්දේශයේ විශේෂ ලක්ෂණ 05 ක් සඳහන් කරන්න.
20) මෙම පොහොර නිර්දේශයේ උපරිම ප්‍රතිඵල ලබා ගැනිම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග 05 ක් සඳහන් කරන්න.
21) වී වගාවේ දී වල් පැළෑටි පාලනය ඉතා වැදගත් ය. වී වගාවේ වල් පැළෑටි කාණ්ඩ 03 සඳහන් කරන්න.
22) රසායනික වල් නාශක භාවිතයෙන් තොරව වී වගාවේ වල් පැළෑටි පාලනය ගත යුතු ක්‍රියාමාර්ග 05 ක් සඳහන් කරන්න.
23) වී වගාවේ දී විවිධ අවධින් මලදී සත්තව පළිබෝධයන්ගෙන් හානි ඇති වේ. එවැනි හානි සිදුවන අවස්ථා 04ක් සඳහන් කරන්න.
24) වී වගාවට බහුලව වැළදෙන රෝග 04 සඳහන් කරන්න.
25) වී වගාවේ පළිබෝධ හානි පාලනය කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග 05ක් සඳහන් කරන්න.
26) වී කරල් වලින් 85% රන්වන් පාට වීම අස්වැන්න නෙළීමට සුදුසුම අවස්ථාවයි. අස්වනු නෙලීමේ පියවර සඳහන් කරන්න.
27) වී වගාව සඳහා වගා දින දර්ශනයක් සකස් කිරීම ඉතා වැදගත්ය. වගා දින දර්ශනය සකස් කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණ සඳහන් කරන්න.

කොම්පෝස්ට් පොහොර සඳහා ප්‍රමිතිය

තෙතමනය	< 25%
වැලි ප්‍රතිශතය(වියළි බර)	< 20%
පී එච් අගය	6.5 - 8.5
කාබන් - නයිට්‍රජන් අතර අනුපාතය	10 - 25
අවම පෝෂ්‍ය පදාර්ථ ප්‍රමාණය (වියළි බරට)	
කාබන් C	20%
නයිට්‍රජන් N	1%
පොස්පරස් P_2O_2	0.5%
පොටෑසියම් K_2O	1%
මැග්නීසියම් MgO	0.5%
කැල්සියම් CaO	0.7%
උපරිම බැර ලෝහ ප්‍රමාණය (වියළි බරට) (mg/Kg)	
කැඩ්මියම් (Cd)	3
ක්‍රෝමියම් (Cr)	50
ඊයම් (Pb)	50
රසදිය (Hg)	50
නිකල් (Ni)	0.5
තුත්තනාගම් (Zn)	50
ආසනික් (As)	3

මූලාශ්‍රය : ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, 2019